වරකාපොල ප්‍රාදේශීය සභාව.

කෑගල්ල දිස්ත්‍රික්කය

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 01 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 10 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 11 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 වරකාපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කල ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ තත්‍ය සංඛ්‍යා සැසඳීම් පිළිබඳ ප්‍රකාශයක් හා අයවැය සංඛ්‍යා ප්‍රකාශනයක් හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) 2010 වර්ෂයේදී සෞඛ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගත් රු. 14,081,190 ක මුදල පොදු තැන්පත් ගිණුම මඟින් ලබා ගෙන වැය කිරීම හේතුවෙන් ණය ප්‍රාග්ධනය යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) රු. 42,670,273 ක් වැයකර සෞඛ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදි කිරීමේ ව්‍යාපෘතිය 2013 ජනවාරි 03 දින වන විට අවසන් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සභාව සතු සියළුම ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කල යුතු වුවද, සුසාන භූමි 07ක්, ක්‍රීඩාපිටි, සහ ආදාහනාගාරයේ වටිනාකම ගණනයකර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර තැන්පත් වෙනුවෙන් ලැබිය යුතු පොලිය වූ රු. 45,420 ක් ගිණුම් ගතකර නොතිබුණි.

1.3.3 <u>නොසැසඳුන පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 02 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 10,716,307 ක් වූ අතර, උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 12,071,379 ක් වූයෙන් වෙනස රු. 1,355,072 ක් විය.

1.3.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂ වල වටිනාකම රු. 9,180,476 ක් වූ අතර, වසරක කාලයක් ඉක්මවා තිබූ ශේෂයන්හි එකතුව රු. 7,359,259 ක් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 20,096,358 ක් විය.

1.3.5 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් රු. 11,640,334 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් සම්බන්ධයෙන් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

02. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 10,425,305 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,323,330 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය තුල මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,898,025 ක පිරිහීමක් දක්නට ලැබුණි.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර්31දිනට සමුච්චිතහිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 7,917 | 6,672 | 1,245 |
| (ii) බදු කුලී | 7,555 | 5,329 | 2,226 |
| (iii) බලපත්‍ර ගාස්තු | 2,026 | 1,334 | 692 |
| (iv) වෙනත් ආදායම් | 13,387 | 25,903 | 12,516 |

2.2.2 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 1,026,463 හා රු. 9,659,114 ක් විය.

03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

(අ) 2004 ජනවාරි සිට 2011 ජනවාරි දක්වා කාලයට අදාලව සභාවේ සේවයේ නියුතුව සිටි සේවකයන් වෙනුවෙන් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට රු. 210,430 ක දායක මුදල් නොගෙවීම මත රු. 105,215 ක අධිභාර මුදල් ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) සභාව මගින් 2006 සිට 2008 වර්ෂවල කාර්තු 03 කට අදාලව රැස් කරන ලද, එකතු කළ අගය මත බදු රු. 395,768 ක් නොගෙවීම හේතුවෙන් රු. 249,165 ක දඩ මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) සභාව විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු නියමිත දිනට නොගෙවීමෙන් නඩු කටයුත්තකට සම්බන්ධ වීමට සිදු වීමෙන් නීතිඥ ගාස්තු ලෙස රු. 29,500 ක් හා නිලධාරීන්ගේ ගමන් වියදම් වෙනුවෙන් රු. 7,056 ක්ද වැය කර තිබුණි.

(ඇ) 2007 වර්ෂයට පෙර සිට ඉදිරියට පැවත එන රු. 2,217,939 ක් වූ වගකීම් ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු. 7,809,427 ක් වූ අතර, ඉන් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂ වල එකතුව රු. 168,299 ක් විය.

04. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

4.1 <u>අභ්‍යන්තර විගණනය</u>

1988 මූල්‍ය හා පරිපාලන රීති මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා ගෙන යාම සභාපතිවරයාගේ කාර්යභාරයක් වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

05. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය

(ii) අයවැය පාලනය

(iii) වත්කම් කළමනාකරණය